මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022.03.25 |

## බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විදේශ විනිමය අලෙවි කිරීම සම්බන්ධව පැහැදිලි කිරීම

2022.03.21 දින සිට බලපැවැත්වෙන පරිදි, මෑතකදී 25% සිට 50% දක්වා වැඩි කරන ලද විදේශ විනිමය ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීමේ අවශ්‍යතාවය බැංකුවලට පමණක් අදාළ වන අතර, විදේශගත ශ්‍රමිකයන්ගේ විදේශ විනිමය ඉපැයීම් සහ අපනයනකරුවන්ගේ අපනයන ආදායම් සඳහා පවතින අවශ්‍යතා කෙරෙහි කිසිදු බලපෑමක් ඇති නොකරන බව ශ්‍රී ලංකා මහ බැංකුව මෙයින් දන්වා සිටී.